# සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත පාරිසරික බලපෑම්

**යූ. පී. එස්. පතිරණ**

සංචාරක ව්‍යාපාරය අද ලෝකයේ ප්‍රබල කර්මාන්තයක් වශයෙන් ඉස්මතු වෙමින් පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංඛ්‍යා ලේඛන වලට අනුව 1998 වර්ෂයේ ජාත්‍යන්තර අපනයන ආදායමෙන් රථවාහන නිෂ්පාදනය, රසායනික ද්‍රව්‍ය හා ආහාර ද්‍රව්‍ය වෙළඳම ආදී සියලු අපනයන කර්මාන්තයන් අභිබවා සංචාරක ව්‍යාපාරය ප්‍රමුඛස්ථානයට පැමිණ තිබේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව ද සංචාරක ව්‍යාපාරය කෙරෙහි වඩාත් සැලකිල්ලක් දක්වීමට හේතු වී ඇත්තේ සංචාරක ව්‍යාපාරය මගින් විශේෂයෙන් රටකට උද කර ගත හැකි ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමෙන් බව නොරහසකි. විදේශීය සංචාරකයන්ගේ පැමිණීම නිසා ඉපැයිය හැකි විදේශ විනිමය ආදායම ශ්‍රී ලංකාව වැනි විදේශ සම්පත් ඌණතාවකින් පෙළෙන රටකට ඇයවැය හිගය යම් ආකාරයකින් හෝ පියවා ගැනීම සඳහා මහෝපකාරී වේ. අද සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීමේ කර්මාන්තයන් අතර සිව්වන ස්ථානයට පැමිණ තිබීමෙන් සංචාරක ව්‍යාපාරයට ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි හිමිව ඇති ප්‍රබල ස්ථානය පැහැදිලි කෙරේ. රැකියා උත්පාදනය කිරීමේ හා ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීමේ කර්මාන්තයක් වශයෙන් ද සංචාරක ව්‍යාපාරයට වැදගත් තැනක් හිමි වේ.

එබඳු ආර්ථික අභිවෘද්ධිය ළඟා කර ගැනීමේ කර්මාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරයට අවතීර්ණ වී තිබුණ ද, අවිධිමත් සංචාරක ව්‍යාපාර සංවර්ධනය නිසාවෙන් ඒ ආශ්‍රිත ගැටලු රැසක් උද්ගතව ඇති බව අමතක කළ යුතු නොවේ. ආර්ථිකමය නොවන ගැටලු අතර පරිසරය මූලික කරගෙන උද්ගත වී ඇති ගැටලු මෙහි දී කිසිසේත් නොසලකා හැරිය නොහැක.

සංචාරක ව්‍යාපාරයේ පදනම ලෙස සැලකෙනුයේ පරිසරය යි. අද ලෝකයේ බොහොමයක් ජනප්‍රිය සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථාන වී ඇත්තේ පරිසරය මූලික කර ගත් ආකර්ෂණ බව නොරහසකි. සංචාරක ආකර්ෂණ ස්වභාවික පරිසරය හා මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසරය වශයෙන් දෙයාකාරයෙකින් දක්විය හැකි ය. දිය ඇලි, ඇළ දොළ, කඳුවැටි, වෘක්ෂලතා, වනාන්තර, වන ජීවීන්, භූ විෂමතා,

අද සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීමේ කර්මාන්තයන් අතර සිව්වන ස්ථානයට පැමිණ තිබීමෙන් සංචාරක ව්‍යාපාරයට ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි හිමිව ඇති ප්‍රබල ස්ථානය පැහැදිලි කෙරේ. රැකියා උත්පාදනය කිරීමේ හා ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීමේ කර්මාන්තයක් වශයෙන් ද සංචාරක ව්‍යාපාරයට වැදගත් තැනක් හිමි වේ.

විවිධ දේශගුණික තත්ත්වයන් ආදිය ස්වාභාවික පරිසරයට ඇතුළත් වන අතර වෙහෙර විහාර, වැව් ජලාශ, පෞරාණික නටබුන්, විවිධ මාදිලියේ පැරණි ඉදිකිරීම්, සංස්කෘතික සංදර්ශන ආදී මිනිසා විසින් නිර්මිත සියල්ල මානව නිර්මිත පරිසරයට ඇතුළත් වේ. සංචාරකයන් ඇදී යන්නේ එම ආකර්ෂණීය පරිසරයන් දැක බලා වින්දනයක් හෝ ආශ්වාදයක් විඳ දරා ගැනීමට ය. කවර හෝ පරිසරයකට වැඩි වැඩියෙන් සංචාරකයන් ඇදී එන්නේ නම් සිදුවන්නේ එම පරිසරයට හානියක් බව අමතක කළ යුතු නොවේ. සෑම පරිසරයකට ම දරා ගත හැකි ප්‍රමාණයක් පවතී. විශේෂයෙන් වඩාත් සංචාරක ආකර්ෂණ බවට පත් වී ඇති සංවේදී පරිසරවලට දරා ගත හැකි ප්‍රමාණයට වඩා සංචාරකයන් ප්‍රමාණයක් ඇදී ඒමෙන් සිදු වී ඇත්තේ පරිසර විනාශයක් බව කිව යුතු ය. උදහරණ වශයෙන් වර්තමානයේ බෝපත් ඇල්ල හා හුම්මානය වැනි ස්වාභාවික ආකර්ෂණවලට සංචාරකයන් වැඩි වශයෙන් ඇදී ඒම නිසා සිදු වී ඇති පරිසර හානිය මැනැවින් පෙන්නුම් කරයි. සංචාරක ආකර්ෂණ වශයෙන් සංචාරකයන් අතර වඩාත් ජනප්‍රිය වන දියඇලි වැනි බොහෝ සංවේදී පරිසර ආශ්‍රිතව සංචාරකයන්ට සේවා සැපයීම සඳහා සංචාරක හෝටල්, ආපන ශාලා, සංචාරක සාප්පු වැනි ගොඩනැගිලි ඉදිවීම් නිසා එම පරිසරයන්ට මහත් හානියක් සිදු වී තිබේ. අභය භූමි වැනි සංවේදී පරිසරවලට ඇදී එන සංචාරකයන් ගේ වාහන මගින් පිට කරන දුම් මගින් ද සංචාරක හෝටල්, ආපනශාලා වැනි ආයතන මගින් මුහුදට හා අභ්‍යන්තර ඇළ මාර්ගවලට මුදා හරිනු ලබන අපද්‍රව්‍ය කරන කොට ගෙන සිදුවන ජල දූෂණය මගින් ද සංචාරක ව්‍යාපාරය අවනතිය කරා යොමු වීමට දායක වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. ශ්‍රී ලංකාවේ ගල්කිස්ස, බේරුවල, හික්කඩුව, උණවටුන වැනි ස්ථානවල වෙරළබඩ ඉදි කර ඇති අනවසර හා අවිධිමත් ගොඩනැගිලි නිසා සිදු වී තිබෙන වෙරළ ඛාදනය මුහුදු ජලය දූෂණය වීම වැනි පාරිසරික ගැටලු ද මැනවින් දිස් වේ. සංවේදී පරිසරයන් ලෙස සැලකෙන දර්ශනීය කොරල් පරවලට සංචාරකය ව්‍යාපාරය නිසා සිදු වී ඇති හානියට කදිම නිදසුන් හික්කඩුව, වැලිගම, කප්පරතොට වැනි ස්ථාන සපයයි. දර්ශනීය කොරල් පර නැරඹීම සඳහා පතුළට විදුරු සවි කළ බෝට්ටුවල ගමන් කරන සංචාරකයන් ගේ බෝට්ටු නිරන්තරයෙන් එම සංවේදී කොරල් පරවල ගැටීම නිසාත්, බෝට්ටු වලින් විසිරෙන තෙල් ආදිය නිසාත්, හික්කඩුවේ පිහිටි කොරල් පර වලින් බහුතරයක් දැනටමත් විනාශ වී ඇති බව වාර්තා වේ.

එබඳුම සංවේදී පරිසර පද්ධතියක් වන කඩොලාන පරිසරයන් තුළට යන සංචාරකයන් ගේ බෝට්ටු නිසා එම පරිසරවලට හානි සිදු වෙමින් පවතින බව බෙන්තොට, කළුවාමෝදර වැනි සංචාරක නිකේතන ආශ්‍රිතව දැකිය හැකි ය. සංචාරකයන් ගේ බෝට්ටු මෙන්ම ජල ක්‍රීඩා නිසා ජල ජීවීන් ගේ වර්ධනයට හා පැවැත්මට තර්ජනයක් වී තිබේ. බොහෝ විට මත්ස්‍ය ජනන භූමි, කොරල්පර හා කඩොලාන පරිසරයන් ආශ්‍රිතව පවතින හෙයින් ඒ ආශ්‍රිතව සිදු කෙරෙන සංචාරක ක්‍රියාකාරකම් මගින් විශාල තර්ජනයක් එල්ල වී ඇති බව ද සත්‍යයකි. දැනට වඳවී යාමේ තර්ජනයට මුහුණ පා ඇති සතුන් අතරට කැස්බෑවා, අලි ඇතුන්, සමනලුන් හා සමහර පක්ෂි විශේෂ ද ඇතුළත් වේ. දකුණු වෙරළබඩ තීරයේ අද බිහි වී ඇති විශාල කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘති ඇත්තෙන් ම වඳවී යාමේ තර්ජනයට මුහුණ පා ඇති එම සත්ත්ව විශේෂය සංරක්ෂණය කිරීමට ඉවහල් වීමකට වඩා වඳවීයාම ඉක්මන් කිරීමට හේතු වී ඇති බව පෙන්නුම් කෙරේ.




**ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් කණ්ඩායමක්**
***(ඡායාරූපය කොනෙයිසානිස් සමාගමේ අනුග්‍රහයෙනි)***

කැස්බෑවන් වර්ධනය වීම සිදු විය යුතුව ඇත්තේ ස්වාභාවික ආකාරයකින් කිසිවෙකු ගේ බාධා කිරීමකින් තොරව වුවද අද සංචාරක ආකර්ෂණ වශයෙන් පවත්වාගෙන යනු ලබන එම බොහොමයක් කැසබු සංරක්ෂණ ව්‍යාපෘතිවල සිදු වන්නේ ස්වාභාවිකත්වයට පටහැනි ක්‍රියාවලියෙකි. වැල්ලේ දමන බිත්තර ඉන් ඉවත් කර වෙනත් තැනකට ගෙන යාමත් කැසබු පැටවුන සංචාරකයන්ට අතින් අල්ලා සුරතල් කිරීමට ඉඩ දීමත්, නුසුදුසු වේලාවන්හි දී අනාරක්ෂිත ව කැසබු පැටවුන් මුහුදට මුදා හැරීමට සංචාරකයන්ට ඉඩ දීමත් ආදී අස්වාභාවික ක්‍රියාවලියක් තුළින් කැසබුවන්ට සිදුවෙමින් පවතින හානිය ඉමහත් ය.

වඳවී යාමේ තර්ජනයට ලක් වී ඇති සතුන් පිළිබඳව සංචාරකයන් වඩාත් අවධානය යොමු කිරීම නිසා ම එබඳු වඳවී යාමේ තර්ජනයට භාජනය වී ඇති සතුන්ගේ ශරීරයේ කොටස් වලින් සාදනු ලබන භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය සංචාරක මධ්‍යස්ථාන ආශ්‍රිතව වැඩිවෙමින් පවතින බව පෙනී යයි. විශේෂයෙන් සංචාරක හෝටල් හා සංචාරක නිකේතන පවත්වාගෙන යනු ලබන සංචාරක සාප්පුවල එබඳු භාණ්ඩ අලෙවිය ප්‍රසිද්ධියේ හා අප්‍රසිද්ධියේ සිදුවෙමින් පවතින බව නොරහසකි. කැසබුවන් මරා උන්ගේ කටුවෙන් නිර්මාණය කළ පනා, හිස පළඳනා, ආභරණ වැනි සංචාරක සමරු භාණ්ඩ ද ඇත් දළින් හා කෙඳිවලින් කරන ලද සමරු භාණ්ඩ ද අලෙවිය මෙයට හොඳ උදාහරණ වේ. සංචාරක ව්‍යාපාරය නිසා එබඳු සතුන්ට සිදුවන විනාශය පමණක් නොව සත්ව හිංසාව ද සංචාරක මධ්‍යස්ථාන ආශ්‍රිතව සුලබව දැකිය හැකි වේ. කැලයෙන් අල්ලා ගත ඉත්තෑවුන් වැනි සතුන් බැඳ දමා සංචාරකයන්ට ප්‍රදර්ශනය කිරීම යට්ටෝගොඩ, සීගිරිය වැනි පෙදෙස්වල දක්නට ලැබේ. විශේෂයෙන් හබරණ ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක වන සංචාරක සපාරි අලි වැඩ සටහන්වලින් සිදුවන සත්ව හිංසාව පිළිබඳව ජනමාධ්‍ය මගින් ද වරින්වර පෙන්වා දී තිබේ. සපාරි අලි වශයෙන් යොදගනු ලබන අලින්ගේ පිට මත යොදනු ලබන සැදලය හා කඹ ගැට වලින් ද අලින් විශාල හිංසාවකට භාජනය කෙරෙන බව ද කියූ වේ.

සංචාරක ව්‍යාපාරවලින් පරිසරයට සිදු කැරෙන හානිය එපමණක් ද නොවේ. විශේෂයෙන් සිංහරාජ වැසි වනාන්තරය වැනි සුවිශේෂී පරිසර පද්ධතීන්වලට ඇතුළු වන සංචාරකයන් ඒම පරිසරයන් හි පවතින අගනා වෘක්ෂ ලතාදියට සිදු කැරෙන විනාශයන් ද සුළුපටු නොවේ. උදාහරණයක් වශයෙන් සිංහරාජ වනාන්තරයේ ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සංචාරක ආකර්ෂණයක් වශයෙන් පැවැති යෝධ පුස්වැල් විනාශ වීමට බලපා ඇත්තේ සංචාරකයන්ගේ ක්‍රියාකාරකම් නිසා බව ප්‍රකට කරුණෙකි. විසිතුරු සමරු භාණ්ඩ වශයෙන් සංචාරකයන් විසින් යම් යම් පාරිසරික වැදගත්කමක් සහිත දේවල් සුවිශේෂී පරිසර පද්ධතීන්ගෙන් ඉවත් කර ගෙන යාම මගින් ද විශාල පරිසර විනාශයක් පමණක් නොව පාරිසරික තුල්‍යතාවට ද (Ecological Balance) හානිකර ලෙස බලපා තිබේ. අද ජාතික නාමල් උයනට ඇදී එන දේශීය සංචාරකයන් විසින් නාමල් උයනේ පිහිටි ගස්වල අතු කඩා එල්ලීමත්, රෝස තිරිවානා කඳුවැටියේ කොටස් කඩා ගෙන යාමට උත්සාහ කිරීමත් පරිසරයට තදබල ලෙස හානි කැරේ. සංචාරකයන් නිසා පරිසරයට සිදු වී ඇති හානි පිළිබඳව තවත් ප්‍රබල සාක්ෂියක් වවුල්පතේ හුණුගල් ගුහාව හා මඩුවන්වෙල වලව්ව ආශ්‍රිතව ද දැක බලා ගත හැකි ය.

> සංචාරක ව්‍යාපාරයේ පදනම ලෙස සැලකෙනුයේ පරිසරය යි. අද ලෝකයේ බොහොමයක් ජනප්‍රිය සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථාන වී ඇත්තේ පරිසරය මූලික කර ගත් ආකර්ෂණ බව නොරහසකි. සංචාරක ආකර්ෂණ ස්වභාවික පරිසරය හා මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසරය වශයෙන් දෙයාකාරයෙකින් දැක්විය හැකි ය.

වවුල්පතේ හුණුගල් ගුහාවේ පිට පැත්තේ තිබූ ඉතා වටිනා කොළයක් හා ගෙඩියක් සහිත ශාක පොසිලයෙහි තිබූ ගෙඩිය කිසිවකු විසින් ගලවා ගෙන ගොස් ඇති නිසා අනාගත පරම්පරාවට එය අහිමි වී ඇත්තේ ය.

තව ද මඩුවන්වෙල වලව්වේ පිරිත්මඩුවේ බිම අතුරා ඇති මාබල් පිගන් කැලි අතර සවි කර තිබූ කාසි හා මුතු කැට ද අද අතුරුදහන්ව ගොසිනි.

සංචාරක ව්‍යාපාරය පරිසරය මූලික කරගෙන ඇති වූවා සේ මෙම සංචාරක ව්‍යාපාරවලින් පරිසරය විනාශ වීම නිසා අවසාන වශයෙන් සංචාරක ව්‍යාපාරය ද විනාශ විය හැකි ය. බ්‍රිතාන්‍ය සංචාරක ව්‍යාපාරය පිළිබඳ විශේෂඥයකු වන ක්‍රිස්ටෝපර් හොලෝවේ වි සින් මේ පිළිබඳව සැලකිල්ලට ගෙන ' සංචාරක ව්‍යාපාරය විසින් සංචාරක ව්‍යාපාරය විනාශ කරයි'(Tourism Destroys Tourism) යනුවෙන් වරක් පවසා තිබේ.

පරිසරය ගැන කථා කරන විට සංචාරක ව්‍යාපාරය නිසා බලපෑම් එල්ල වී ඇති ශ්‍රී ලංකාවේ සමාජයීය පරිසරය ගැන ද අවධානය යොමු කළ යුතුව ඇත. ශ්‍රී ලංකාවේ බොහෝ සමාජයීක ගැටළු මතු කිරීම සඳහා සංචාරක ව්‍යාපාරය ඉවහල් වී ඇති බවට චෝදනා එල්ල වී තිබේ. සමාජයීක වශයෙන් ඉස්මතු කර දක්වෙන එබඳු ගැටළු අතරට සමාජ රෝග පැතිරයාම වැඩිවීම, ලිංගික අපචාරය වැඩිවීම, ගණිකා වෘත්තිය, ළමා අපයෝජනය, මත් ද්‍රව්‍ය උවදුර හා ළමා යාචකයන් බිහිවීම වැනි සමාජයීක ප්‍රශ්න බිහි වී තිබේ. විශේෂයෙන් මෙබඳු සමාජයීක ප්‍රශ්න පිළිබඳව ජනමාධ්‍ය මගින් කරනු ලබන පුළුල් ප්‍රචාරයන් කෙනෙක් දුරට සත්‍ය දැයි විමසා බැලීම උගහට ය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවට පැමිණෙන සියලුම විදේශ සංචාරකයන් මෙබඳු සමාජයීක ප්‍රශ්න ඇති කිරීම සඳහා මූලික වී ඇතැයි උපකල්පනය කිරීම ද සාධාරණ නොවේ.

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ සංචාරකයන්ගෙන් බහුතරයක් පැමිණෙන්නේ කණ්ඩායම් වශයෙන්, ඔවුන් විසින් පිටරටක දී මිළදී ගනු

ලබන චාරිකා පැකේජයකට අනුකූලව ය. ඔවුන් විසින් මිලදී ගෙන ඇති එම චාරිකා පැකේජය මගින් ඔවුන් ශ්‍රී ලංකාවේ ගත කරන දින ගණන, රාත්‍රී ගත කරන හෝටල් හා නැරඹීමට නියමිත ස්ථාන ආදී සියල්ල කල්තියාම තීරණය කර තිබේ. එබඳු කණ්ඩායමකින් පැමිණෙන සංචාරකයෙකුට එම නියමිත කාල සටහනෙන් මිදී සමාජයීය ගැටළු මතු කෙරෙන එබඳු අපචාර කටයුතු වලට සම්බන්ධ විය හැකිදැයි ප්‍රශ්නයකි .

කෙසේ වුවද තනි තනිව පැමිණෙන කුඩා ප්‍රතිශතයක් වූ සංචාරකයන් අතලොස්සක් පමණක් මෙබඳු අයහපත් ක්‍රියාකාර කම් සඳහා සම්බන්ධ වීමට ඉඩ තිබේ. දැනටමත් බේරුවල, හික්කඩුව, තංගල්ල වැනි වෙරළ බඩ සංචාරක මධ්‍යස්ථාන ආශ්‍රිතව සංචාරක ව්‍යාපාරය නිසා එබඳු සමාජයීය ගැටළු උද්ගත වී ඇති බව ද පිළිගත යුතුව ඇත.

**පාරිසරික ගැටලු සඳහා විසඳුම්**

සංචාරක ව්‍යාපාරය නිසා ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන එබඳු පාරිසරික හා සාමාජයික ගැටලු සඳහා විසඳුම් බොහෝ විට ක්‍රමවත් සැලසුම්කරණය මගින් ලබා ගත හැකි බව පෙනී යයි. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සැලසුම් සහගතව ආරම්භ වූයේ 1966 වර්ෂයේ ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමෙන් පසුව වුවද, ඊට බොහෝ කලකට පෙර සිට එනම් බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ අවසාන භාගයේ සිට සංචාරක ව්‍යාපාරයට අඩිතාලම යෙදී තිබිණ. ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමෙන් පසුව සංචාරක ව්‍යාපාරය සැලසුම් සහගතව සංවර්ධනය කිරීම අරඹා තිබේ.

විශේෂයෙන් පරිසරය හා වෙරළ සංරක්ෂණය පිළිබඳ නීතිමය බලධාරීත්වය සහිත මධ්‍යම පරිසර අධිකාරිය හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව 1980 ගණන්වලදී පිහිටුවීමෙන් පසු සංචාරක සංවර්ධනයේදී පරිසරයට සිදුවන බොහොමයක් හානි අවමකර ගැනීමට භාග්‍යය උදා වී තිබේ.

සංචාරකයන්ගේ කටයුතු නිසා සංවේදී පරිසරයන්ට සිදුවන හානි අවම කිරීම සඳහා සංචාරකයින් මෙන් ම දේශීය ප්‍රජාව දැනුවත් කිරීම ඉතා අත්‍යවශ්‍ය වේ. පරිසර දූෂණය හා පරිසර හානි බෝහොමයකට විශේෂයෙන් මූලික වී ඇත්තේ, විදේශ සංචාරකයින්ට වඩා තරුණ දේශීය සංචාරකයන් බව පැහැදිලිව පෙනී යන හෙයින්, පරිසරයට ආදරය කිරීම හා පරිසර සංරක්ෂණය කිරීම පිළිබඳව විවිධ මට්ටම්වල දේශීය ප්‍රජාව දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත් වී තිබේ.

විශේෂයෙන් ලංකා සංචාරක මණ්ඩලයේ ප්‍රජා සම්බන්ධතා අංශය මගින් පාසල් සිසුන්, ගුරුවරුන්, ගුරු උපදේශකයන්, ග්‍රාමසේවා නිලධාරීන්, ග්‍රාමීය නායකයන් සමෘධි සංවර්ධන නිලධාරීන්, නීතිය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන්ට සංචාරක ව්‍යාපාරය මගින් උද කෙරෙන ප්‍රතිලාභ හා එහි අයහපත් ප්‍රතිඵල පිළිබඳව දැනුවත් කිරීම සඳහා දියත් කර ඇති වැඩ සටහන් තවදුරටත් ක්‍රමවත්ව හා පුළුල්ව ව්‍යාප්ත කළ යුතුව ඇති බව ද සඳහන් කළ යුතුව ඇත.

පාසල් සිසුන් හා තරුණයන් අතර අද පරිසරය සුරැකීම පිළිබඳ ප්‍රවණතාවක් මතු වී ඇති හෙයින්, එබඳු පරිසර භට කණ්ඩායම් වැනි අංශවලින් සංවේදී පරිසරයන්ට ඇදී එන සංචාරකයන්ගේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට කටයුතු යෙදීම ද ඉතා වැදගත් වේ. දැනටමත් පොලොන්නරුව පුරාවිද්‍යා භූමියේ ද වවුල්පනේ හුණුගල් ගුහාව පුවක්මල් ඇල්ල හා ජාතික තාමල් උයන ආශ්‍රිතව ද මෙබඳු දැනුවත් කිරීම් හා පිරිස් කළමනාකරණ කටයුතු සිදුවීම සතුටට කරුණකි.

සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ශ්‍රී ලංකාවේ පැන නැගී ඇති සමාජයීක අයහපත් බලපෑම් අවම කිරීම සඳහා දේශීය ප්‍රජාව දැනුවත් කිරීම ඉතා අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් සංචාරක මධ්‍යස්ථාන ආශ්‍රිත ප්‍රදේශවල ජනතාව ඒ පිළිබඳව දැනුවත් කිරීම් වැඩ පිළිවෙලක් ක්‍රමවත්ව හා පුළුල්ව දියත් කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. සමාජ රෝග හා මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳව මෙන් ම

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සැලසුම් සහගතව ආරම්භ වූයේ 1966 වර්ෂයේ ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමෙන් පසුව වුවද, ඊට බොහෝ කලකට පෙර සිට එනම් බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ අවසාන භාගයේ සිට සංචාරක ව්‍යාපාරයට අඩිතාලම යෙදී තිබිණ.

එහි භයානකකම් පිළිබඳව දේශීය ජනතාව දැනුවත් වී සිටින්නේ නම් බොහෝ විට සමාජ අපචාර සිදුවීමට ඉඩක් නොමැත. සංචාරකයන් විසින් ළමයින් අපයෝජනයට භාජනය කිරීමේ ප්‍රශ්නයට එක් වැදගත් පියවරක් වශයෙන් දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමෙන් ළමා අපයෝජකයන්ට හා කුට්ටාලිකරුවන්ට දැඩි දඬුවම් දැනටමත් නියම කර ඇත. දැනට ඉතා අත්‍යවශ්‍ය වී ඇත්තේ එම නීතිමය විධිවිධාන හා දඬුවම් පිළිබඳව සංචාරකයන් හා දේශීය ජනතාව මැනැවින් දැනුවත් කිරීම පමණි.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ගැටළු හා ඒවා අවම කිරීම සඳහා දිය හැකි ආසන්නතම විසඳුම් පිළිබඳව ඉහත දක්වා ඇත.

මෙහිදී සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ගැටලු සැලකිල්ලට ගැනීමේදී සංචාරක ව්‍යාපාරය මගින් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට උදා කෙරෙන ආර්ථික, පාරිසරික, සාමාජයීය හා සංස්කෘතික ප්‍රතිලාභ සම්බන්ධයෙන් ද සැලකිල්ලට ගත යුතු වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරයට අවතීර්ණ වී ඇත්තේ, එමගින් ළඟා කර ගත හැකි ආර්ථික අභිවෘද්ධිය මූලික වශයෙන් සැලකිල්ලට ගැනීමෙනි.සංචාරක ව්‍යාපාරය දැනටමත් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයන කර්මාන්ත අතර සිව්වන ස්ථානය ලබා ඇති බව ද අමතක කළ යුතු නොවේ.

දිනෙන් දින උග්‍ර වෙමින් පවතින ශ්‍රී ලංකාවේ තරුණ රැකියා වියුක්තිය පිළිබඳ ප්‍රශ්නයට ද සංචාරක ව්‍යාපාරය මගින් සතුටුදායක ප්‍රමාණයකින් විසඳුමක් ලබා ගත හැකි බව පෙනී යයි.

සංචාරක ව්‍යාපාරයේ වර්ධනය හේතුවෙන් ඍජු හා වක්‍ර යන දෙයාකාරයෙන් ම රැකියා අවස්ථා උදා කැරේ.

සංචාරක ව්‍යාපාරයේ හොඳ හා නරක අප විසින් තුලනාත්මකව සලකා බැලීමේදී අප වඩාත් සැලකිල්ලක් දැක්විය යුතු වන්නේ, ශ්‍රී ලංකාවේ දැනට පවතින ආර්ථික අර්බුදයට සංචාරක ව්‍යාපාරය හැරුණ විට වෙනත් විකල්ප කර්මාන්තයකින් පිටුවහලක් ලබා ගත හැකිව ඇත්තේ ද යන ප්‍රශ්නය සිහියේ තබාගෙන ය. දැනට ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයන ප්‍රධාන කර්මාන්ත වන ඇඟළුම් කර්මාන්තය, විදේශ රැකියා නියුක්තිය හා තේ කර්මාන්තය ආදියේ අනාගත ස්ථාවර භාවය පිළිබඳව දැනටමත් ගැටලු මතුවී ඇති බව මෙහදී විශේෂයෙන් ම අමතක කළ යුතු නොවේ.

සමස්තයක් වශයෙන් සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් ම සලකා බැලීමේදී පැහැදිලි වන වැදගත් දෙයක් නම් යම් පිරිවැයක් රහිත කර්මාන්තයක් ලොව නොමැති බව යි. අනෙක් අතට අප විසින් සංවර්ධනය යැයි හුවා දක්වන සෑම සංවර්ධනයක ම පිරිවැයක් ද අඩංගු වී පවතී. මෙහිදී වඩාත් වැදගත් වන්නේ ක්‍රමානුකූල හා විධිමත් සැලසුම්කරණ ක්‍රියාවලියක් තුළින් පිරිවැය හා ගැටළු අවම කර ගැනීම වේ.

ශ්‍රී ලංකාවේ සංචරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ද පැවසිය හැක්කේ මෙය යි. ජාතික වශයෙන් ක්‍රමවත් හා විධිමත් සැලසුම්කරණ ක්‍රියාවලියක් තුළින් සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ගැටළු අවම කිරීමටත් සංචාරක ව්‍යාපාරයේ සියලූ ප්‍රතිලාභ උපරිම කිරීමටත් කටයුතු කිරීම මෙහිදී වඩාත් ඥානවන්ත ක්‍රියාවක් වේ. ❑